

ලියා දන්වන වග යි

## නිශ්ශබ්දතාව ප්‍රශ්න නොවිසඳයි

ශ්‍රී ලංකා රජය එල්ටීටීඊ සංවිධානය සමගින් කරන ලද අවසන් යුද්ධයේදී සිදු වූවා යයි කියනු ලබන යුද අපරාධ සම්බන්ධ කරගනිමින් තනන ලද -ශ්‍රී ලංකාස් කිලිං ෆීල්ඩ්ස්" නම් රූපවාහිනී වාර්තාව විසින් ඇති කරන ලද ආන්දෝලනය තවමත් නිම වී නැත. ශ්‍රී ලංකා හා මහින්ද රාජපක්ෂ විරෝධීන්ගේ අමන්දානන්දයටද ශ්‍රී ලාංකිකයන්ගේ බලවත් සන්තාපයටද වික්ෂෝපයටද කෝපයටද හේතු වෙමින් මේ වැඩ සටහන පසුගිය දා ඕස්ට්‍රේලියාවේ ඒබීසී රූපවාහිනියෙන්ද ප්‍රදර්ශණාය කෙරුණි. මේ වැඩ සටහන මගින් සමස්ථ ප්‍රේක්ෂකයන් තුළ ඇති කරනු ලැබ ඇති කම්පනය සුලු පටු නොවේ.

එල්ටීටීඊ සංවිධානය වැනි සාමාන්‍ය ගරිල්ලා සංවිධානයකින් ඔබ්බට ගිය සුවිශේෂී ගති ගුණ වලින් හෙබි සංවිධානයක් සමගින් කරන ලද යුද්ධයකදී මේ ඕනෑම සිදුවීමක් සිදුවීමට ඉඩ කඩ ඇති බව සාමාන්‍ය බුද්ධියක් ඇති ඕනෑම අයෙකුට වැටහෙනවා ඇත. එසේ හෙයින් මේ කිසිම දෙයක් සිදුවුණේ නැතැයි කියා නිශ්ෂබ්දව සිටීම රජය විසින් කරනු ලබන මහත් අනුවණකමකි.

මේ වාර්තා චිත්‍රපටය සත්‍ය හෝ වේවා අසත්‍ය හෝ වේවා මෙමගින් ශ්‍රී ලංකාව පිළිබඳ ඇති කර ඇති චිත්‍රය අතිශය අප්‍රසන්න ය.

රජය මේ මොහොතේ කළ යුතුව ඇත්තේ බුද්ධිමත් ලෙස කරුණු දැක්වීමක් සහ ක්‍රියාත්මක වීමකි. එසේ නැතිව "ශවේන්ද්‍ර සිල්වා අපේ හතුරන්ට ඇට්ටි හැලෙන්ඩ දුන්නා" යි කියමින් ස්වයං මෝහනයකට පත්ව අමන නැටුම් නැටීමෙන් මහත්ම හානිය සිදු කරන්නේ අපේ රටටම ය. ශ්‍රී ලංකාවේ පත්තර පිටු පුරවන විද්‍යුත් මාධ්‍ය කළඹන මේ ස්වයං වින්දනයෙන් ජාත්‍යන්තරයට වැඩක් නැත. ඔවුනට අවශ්‍ය මේ යුද අපරාධ සිදු වූවාද නැද්ද යන්න පිළිබඳව රජය සොයා බලන්නේ ද නැද්ද යන කාරණය පමණකි. රජය ඒ වගකීම පැහැර හැරීම චැනල් ෆෝ කාරයන්ටත් තවත් එවැනි බලවේග වලටත් ශ්‍රී ලංකාවට එරෙහි කිලිං ෆීල්ඩ් එකක් සාදා දීමක්ම වන බව ලියා තැබිය යුතුම ය.

කොයි තරම් කටුක වුවද ඒ සත්‍යයෙන් ගැළවෙන්නට අපට නොහැකි ය

**සංස්කාරක**

### සංස්කාරක සටහන

නව සහශ්‍රයට සන්නස පුවත්පත විවෘත වේදිකාවකි. මෙහි පළවන ලිපි වල අන්තර්ගත වන්නේ එම ලිපි ලියන ලේඛකයනගේ අදහස් ය. ඒ ලිපි තුළින් කතා බහ කෙරෙන කාරණා පිළිබඳව ඔබට ද මතයක් ඇත්නම් ඔබේ අදහසට ද ඉඩක් ලබා දෙන්නට අපි සැමවිටම උත්සාහ කරන්නෙමු. ඔබේ ලිපිය **ඉතා කෙටියෙන්** ලියන්න. පුවත් පතේ ඉඩ, අදහස නිරවුල් ව ඉදිරිපත් නොකිරීම, වැරදි භාෂාව, වැනි හේතු මත සියලුම ලිපි සංස්කරණයට භාජනය විය හැකි බව සළකන්න අනන්‍යතාව හෙළි නොකර එවන ලිපි සඳහා පුවත්පතේ ඉඩක් නොලැබෙන බවද කරුණාවෙන් සළකන්න .

**දැන් www.sannasa.com ඔස්සේ ද සන්නස වෙබ් අඩවියට පිවිසිය හැකි බව සතුටින් දන්වමු**

# කෝටිපතියන් පැටව් ගසන බිමේ
# තොරතුරු දැනගැනීමේ අයිතිය වැළලීම

ශ්‍රීලාල් සෙනෙවිරත්න



ජනතාවට තොරතුරු දැනගැනීමට ඇති අයිතිය පිළිගෙන එය නිත්‍යානුකූලව බලත්මක කිරීම සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කෙරුණ යෝජනාවක් ශ්‍රී ලංකාවේ ආණ්ඩු පක්ෂයේ මහජන නියෝජිතයන් විසින් පරාජයට පත්කිරීම මෙවර ලොව වට පුවත් වියමනේ සාකච්ඡාවට ලක්කරන්නේ එය ලෝකයේ විශාල වශයෙන් අවධානයට ලක්වූ සිද්ධියක් නිසා හෝ ලෝකයේ බොහෝ පිරිසකට බලපාන සිදුවීමක් වූ නිසා නොවේ. එය ලාංකිකයන් වන අපට බෙහෙවින් වැදගත් වන මාතෘකාවක් වන බැවිනි.

වසර කීපයක සිට වරින්වර මතුවෙමින් නැවත යටපත් වන තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ මාතෘකාව ඉකුත් මාසයේ නැවත කරලියට පිවිසියේ විපක්ෂයේ ප්‍රධාන පක්ෂය වන එක්සත් ජාතික පක්ෂයේ නියෝජ්‍ය නායක කරු ජයසූරිය විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යෝජනාවක් හේතුවෙනි. තමන් විසින් මාස කීපයකට පෙර පෞද්ගලික මන්ත්‍රී යෝජනාවක් ලෙස පාර්ලිමේන්තුවට ගෙන ඒමට උත්සාහ කළ තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ වන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ගෙන එන්නට කරු ජයසූරිය නැවත උත්සාහ කළ අතර ආණ්ඩු පක්ෂය වෙනුවෙන් දිනේෂ් ගුණවර්ධන ඇමැතිවරයා එයට සිය විරෝධය පළ කළේය. එම පනත ගෙන ඒමට ආණ්ඩු පක්ෂය විරුද්ධ බව ගුණවර්ධන ඇමැතිවරයා ප්‍රකාශ කළ බැවින් ඒ සම්බන්ධයෙන් ඡන්ද විමසීමක් සිදුකෙරුණු අතර ඒ අවස්ථාවේ සභාවේ සිටි ආණ්ඩු පක්ෂයේ සියළු මන්ත්‍රීවරුන් පනත ගෙන ඒමට විරුද්ධව ඡන්දය ප්‍රකාශ කළහ. ජයසූරිය මන්ත්‍රීවරයා විසින් ගෙන ඒමට උත්සාහ කළ තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනත කුණු කූඩයට විසිවිය. ඒත් සමගම වසර ගණනාවක් තිස්සේ ශ්‍රී ලංකාවේ සිවිල් සමාජය ඉල්ලා සිටි තොරතුරු දැනගැනීමේ නිල අයිතිය වැළලී ගියේය.

කරු ජයසූරිය විසින් පෞද්ගලික මන්ත්‍රී යෝජනාවක් ලෙස පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නට සූදානම් වුවද තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ වන පනත ඔහු හුදකලාව කෙටුම්පත් කළ පනතක් නොවේ. තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ කතාබහ මුලින්ම ඇතිවන්නේ ලංකාවේ සිවිල් සමාජයේ මිස පක්ෂ දේශපාලන සමාජයේ නොවේ. ඒ 90 දශකයේදීය. එවක සිවිල් සමාජයේ ඇතිවූ යම් යම් සංවාදයන් හිදී තොරතුරු දැනගැනීමේ අයිතිය රට වැසියන්ට අවශ්‍යය බවට වන මතවාදයක් රට තුළ ගොඩනැගිණ. 1994 වසරේදී චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරණතුංග ජනාධිපති ධුරයට පත් වූ පසු මාධ්‍ය සංවිධාන සහ අනෙකුත් සිවිල් සංවිධාන එක්ව ඇයට මේ පිළිබඳ කළ කරුණු දැක්වීම්වලින් පසු ඒ පිළිබඳ සොයාබැලීමට මානව හිමිකම් පිළිබඳ නීතිඥවරයෙකු වන ආර්.කේ.ඩබ්. ගුණසේකරගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් පත්කරනු ලැබීය. තොරතුරු දැනගැනීමේ අයිතිය රට තුළ නීතිගත කළ යුතු බව එම කමිටුව ප්‍රකාශ කළේය.

පසුව 1998 කොළඹ ප්‍රකාශනයේදීත් තොරතුරු දැනගැනීමේ අයිතිය තහවුරු විය යුතු බව පිළිගැනීමට ලක්විය. අනතුරුව යටපත්ව ගිය තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ කථිකාව යළි ඇතිවෙන්නේ 2003 වසරේදීය. රනිල් වික්‍රමසිංහ අග්‍රාමාත්‍ය ධුරය දැරූ ඒ සමයේදී මෙය පනතක් ලෙස කෙටුම්පත් කෙරුණු අතර එය කැබිනට් මණ්ඩලය විසින් ද සම්මත කළේය. එහෙත් එය පාර්ලිමේන්තුවට ගෙන එන්නට පෙර රනිල්ගේ ආණ්ඩුව බිඳ වැටුණි.

කරු ජයසූරිය පුද්ගලික මන්ත්‍රී යෝජනාවක් ලෙස පාර්ලිමේන්තුවට ගෙන එන්නට උත්සාහ කළේ චන්ද්‍රිකා මෙන්ම රනිල්ද අනුමැතිය දෙමින් එලෙස ඉදිරියට ගෙන ආ පනත් කෙටුම්පතය. මුල්වරට එය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කෙරුණු අවස්ථාවේ ආණ්ඩුව එය සංවාදයට ලක්වීම වැළැක්වූයේ එය පුද්ගලික මන්ත්‍රී යෝජනාවක් ලෙස නොගෙනන ලෙසත් ආණ්ඩුවේ යෝජනාවක් ලෙස එය ඉදිරිපත් කරන්නට කටයුතු කරන බවත් පාර්ලිමේන්තුවේදී දිනේෂ් ගුණවර්ධන විසින්ම විපක්ෂයට පොරොන්දුවක් ලබාදෙමිනි. එහෙත් ඒ පොරොන්දුවද ඡන්ද පොරොන්දුවක් සේ යටපත්ව ගිය අතර ඉකුත් මාසයේ කරු ජයසූරිය විසින් නැවත පාර්ලිමේන්තුවට ගෙන එන්නට සූදානම් වූයේ එලෙස

11 වන පිටට

**Sannasa**
61 Nettle Drive
Hallam Vic 3803 Australia
**Web: www.sannasa.net**
**www.sannasa.com**

email :sannasanews@gmail.com
Tel/Fax :03 9796 4241**after 4pm**

**සංස්කරණය / Editor**
අසෝක සුබසිංහ
Asoka Subasinghe

**සංස්කරණ උපදේශක / Editorial Advisor**
ජගත් ජේ එදිරිසිංහ
Jagath J Edirisinghe

**සහය සංස්කාරක / Asst. Editor**
ශ්‍රීනාත් මද්දුමගේ Srinath Maddumage

**ක්‍රීඩා සංස්කාරක / Sports Editor**
අසෝක සිල්වා Asoka Silva

**රූ රටා / Graphics**
ශානලී එදිරිසිංහ Shanalee Edirisinghe

**වෙළඳ දැන්වීම් / Advertising**
03 8707 4604
0402 025 516
**email** ads.sannasa@gmail.com

**සන්නස පිරිවර**
සිසිර දිසානායක
වි ක ධර්මබන්ධු
ශ්‍රියාණි මද්දුමගේ

පුවත්පතේ පලවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා/ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සලකන්න සන්නස නව සහශ්‍රයට පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දැක්වීමට අවසර ඇත

**සේයා රූ / Photography**
Prasanna Kurukularatna

**සම්බන්ධීකරණය**

**NSW**
Lakshman Kodituwakku
02 9626 7660
02 9837 5055

**QLD**
Ananada Samaratunga
07 3372 7953

**SA**
Chandra Eeriyagama
08 8331 2318

**WA**
Rev
08 9456 1972

**ACT**
Asoka Nimalasiri
0400 429 031